**ශීර්ෂය 193 – කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 193 – කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 295.52 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 283.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 11.56 ක් හෙවත් සියයට 3.91 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 243.60 | 233.75 | 9.85 | 4.04 |
| මූලධන | 51.92 | 50.21 | 1.71 | 3.29 |
| **එකතුව** | **295.52** | **283.96** | **11.56** | **3.91** |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 5.50 | 5.44 | 2.50 | 3.72 | 20.00 | 13.64 |

**2.3** **පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 14.46 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0016/0095/000 | 0.09 |
| 6000/0000/00/0017/0026/000 | 14.32 |
| 6000/0000/00/0018/0098/000 | 0.05 |
| **එකතුව** | **14.46** |

**2.4**

**විගණන නිරීක්ෂණය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.	ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**------------------------------------------------**

**3.1	ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**------------------------------------------**

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2	විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

අමාත්‍යාංශය යටතේ ඇති අංශ 12 ක් සඳහා රු.868,800 ක් වටිනා සේවක සඟරාවේ පිටපත් 4344 ක් නිකුත් කර තිබුණද, එම අංශ මඟින් ඒවා ලද බවට තහවුරු කිරීම් ලබා දී නොතිබුණි.

**3.3	විසර්ජන ගිණුම**

**----------------**

**අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	මුලධන හා පුනරාවර්තන වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.685,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ)	පුනරාවර්තන වැය විෂයයන් 6 ක් හා මුලධන වැය විෂයයන් 6 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4	පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

සේවා දායකයන් විසින් ආපදාවලට ලක්වූවන් වෙත ගෙවීම සඳහා වන්දි කොමසාරිස් කාර්යාලය වෙත ලබාදුන් රු. 14,324,578 ක් වර්ෂ 6 ක කාලයක සිට නොගෙවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**3.5	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 290,715 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 03 සිට වර්ෂ 05 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ නිරවුල් කර ගැනීමට අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත්වී තිබුණි.

**3.6	වත්කම් කළමනාකරණය**

**---------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාව මඟින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.4 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක සහරා භෞතික සත්‍යාපනය**

2016 වර්ෂයට අදාළ සේවක සහරා භෞතික සත්‍යාපනයේ දී 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.49,200 ක් වටිනා සහරා 358 ක ඌනතාවයන් හා 2009 වර්ෂයේදි සහ 2013 වර්ෂයේදී එකතුව රු.5,600 ක් වටිනා සහරා 56 ක අතිරික්තයන් අනාවරණය වී තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තු දෙකකට අයත් මෝටර් රථ 3 ක් විධිමත් පරිදි අමාත්‍යාංශයට පවරා ගැනීමෙන් තොරව අමාත්‍යාංශය භාරයේ පැවැතුණි. ඉන් එක් දෙපාර්තුමේන්තුවකට අයත් වාහනයක් සමාලෝචිත වර්ෂයේදී ධාවනයට යොදා නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

**3.7 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 2016 අංක 3 දරන සේවකයින්ගේ ජාතික අවම වේතන පනත | - | අමාත්‍යාංශ පරිශ්‍රයේ සේවයේ යොදවා සිටින ආරක්ෂක නිලධාරීන්ට මෙම පනත ප්‍රකාරව අවම වැටුප් ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2016 අංක 4 දරන සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත. | - | අමාත්‍යාංශ පරිශ්‍රයේ සේවයේ යොදවා සිටින ආරක්ෂක නිලධාරීන්ට පනත ප්‍රකාරව අයවැය සහන දීමනා ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2005 අංක 10 දරන කම්කරු වන්දි සංශෝධන පනතේ 23(ඒ) වගන්තිය | 110,000 | වන්දි කොමසාරිස් විසින් අයදුම්පතක් පිළිබඳ සාක්ෂි කැඳවා විභාග කිරීමෙන් පසු නියෝගයක් හෝ නඩු තීන්දුවක් මගින් ප්‍රදානය කරනු ලබන වන්දි මුදල එම නියෝගයේ හෝ නඩු තීන්දුවේ දින සිට දින 30 ක් ඇතුළත අදාළ ආබාධිත කම්කරුවාට හෝ කොමසාරිස් වෙත ගෙවීම හෝ තැන්පත් කිරීම කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 02 ක් තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

---------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1646 | - | අමාත්‍යාංශය සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3.8 දේශිය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විධිමත් පරිදි ඉදිකිරීම් නොකළ ව්‍යාපෘති**

---------------------------------------

1954 පෙබරවාරි 12 දිනැති අංක 10640 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය යටතේ අම්පාර අභය භූමියේ හෙවත් ගල්ඔය නිම්න ඊසාන දිග අභය භූමියට අයත් ඉඩමක අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ සිට සංචාරක නිවාසයක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනතේ 469 වන අධිකාරී බලය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරයක් ලබාගෙන නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.(i)(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ඉටු කළ යුතු ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුව යනාදිය අමාත්‍යාංශය විසින් ඉටුකර නොතිබුණි. එමෙන්ම එම ඉදිකිරීමට අදාළ ගොඩනැගිලි සැලැසුම 2017 ජූලි 31 දින වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කර නොතිබුණි. එම ඉඩම් කොටසේ අයිතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර 2017 මාර්තු 23 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ නමුත්, එම ගිවිසුම අනුව ඉඩමේ පූර්ණ අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු විය. එබැවින් අමාත්‍යාංශයට නීත්‍යානුකූලව හිමිකමක් නොමැති රක්ෂිත භූමියක පිහිටි ඉඩමක සිදුකළ මෙම ඉදිකිරීම් වෙනුවෙන් 2017 මැයි මාසය අවසන් වන විට රු.මිලියන 16.3 ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

( ආ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

"සුනිසි මෙහෙවර" වැඩසටහන වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.8,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.2,000,000 ක් ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ දුම්රිය මැදිරි 08 ක දැන්වීම් පලකිරීමට තීරණය කර තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ අදියරේදී නිසි ශාක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හා නිසි පිරිවැය ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රමයක් සහිතව සැලැසුම් සකස් නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම අනාර්ථික බව පසුව තීරණය කර ව්‍යාපෘතිය අත්හැර තිබුණි.

**3.9 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු පහත සඳහන් අවස්ථා කිහිපයක් විගණනයේදී අනාවරණය විය.

(අ) රාජ්‍ය සේවාවන් වඩා සඵලදායීව කාර්යක්ෂමව හා මහජන හිතකාමීව ඉටු කිරීම සහතික කිරීම සඳහා වූ තොරතුරු සන්නිවේදනය තාක්ෂණය විශේෂයෙන් ඉ - රාජ්‍ය ක්‍රමවේදයක් සඵලදායී ලෙස භාවිතාව සඳහා 2014 නොවැම්බර් 30 දිනැති අංක SB/5/1/2/1 හා ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණි. ඒ අනුව නිලධාරීන් සඳහා ඊමේල් ලිපිනයන් සකස් කර තිබුණද සැලැස්මේ සඳහන් ප්‍රධාන කාර්යයන් 20 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය එක්ව ශ්‍රී ලංකාව තුළ වෘත්තීයමය සුරක්ෂාව ඇතිකරලීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කර තිබුණි. කෙසේ වුවද වෘත්තීය සුරක්ෂාව ඇතිකරලීම සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ උපායමාර්ගයක් ලෙස වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ නව පනතක් සම්මත කරගැනීම දක්වා තිබුණ ද එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉටු කර නොතිබුණි.

**3.10 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව සහ සේවක භාරකාර අරමුදල සඳහා ආරක්ෂක සේවා සැපයීමට අදාළ වූ ගිවිසුම ප්‍රකාරව මාසිකව ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛනයෙහි සාවද්‍ය ලෙස නිලධාරීන් 16 දෙනෙකුගේ නම් ඇතුළත් කර ඉහත ආයතන 3 ට කිසිදු සේවාවක් නොසපයා රු.4,838,000 ක් ආරක්ෂක සේවාව ලබාදුන් ආයතනය විසින් ලබාගෙන තිබුණි.

## 3.11 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** උසාවි බල ප්‍රදේශ 15 ක් තුළ 2016 වර්ෂයට පෙර පැවරූ නඩුවලින් දැනට විභාගවෙමින් පවතින මාරක අනතුරු නඩු 153 ක් සහ මාරක නොවන අනතුරු නඩු 380 ක් මාස 08 ක සිට අවුරුදු 20 දක්වා වූ කාල පරාසයක් සිට විභාග වෙමින් පැවතිණි. නඩු ප්‍රමාදවීම මත පැමිණිලි පාර්ශවයන්ට හිමි වන්දි මුදලේ වර්තමාන අගය, හීන වීමක් සිදුවන අතර නීති හා අනෙක් වියදම් අධික වීම මත වන්දි මුදලේ නිසි ප්‍රතිලාභය ලැබීම පිළිබඳ මතභේදාත්මක බවක් පැවතිණි.

**(ආ)** ආපදාවන්ට ලක්වන සේවකයින් සඳහා වන්දි මුදල් ලබාදීම 2005 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනතේ iv උපලේඛනයට අනුව සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංශෝධනයන් සිදුකර වර්ෂ 11 කට අධික කාලයක් ගත වී තිබුණද වර්තමානයේ පවතින වැටුප් මට්ටම් හා මිල මට්ටම් සැලකිල්ලට ගෙන වන්දි මුදල් සංශෝධනය කිරීම කෙරෙහි වන්දි කොමසාරිස් කාර්යාලයේ අවධානය යොමු වී නොතිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේදී වයස් සම්පූර්ණත්වයට පත්ව තිබුණු ප්‍රතිලාභින් 427 ට අදාළ වූ රු.8,059,437 ක ඉතිරි කිරීම් පාස් පොත් වන්දි කොමසාරිස් කාර්යාලය සතුව පැවතියද, ඒවා නිදහස් කිරීමේ කාල පමාව වර්ෂ 1 ක සිට වර්ෂ 30 ක් දක්වා වී තිබුණි. එමෙන්ම එම ඉතිරි කිරීමේ පාස් පොත්වලට පොලී එකතු කිරීම සඳහා අදාළ බැංකු පොත් ඉදිරිපත් නොකිරීම නිසා ඊට අදාළ පොලී මුදල්ද අහිමි වී තිබුණි.

**(ඈ)** අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් අනතුරට ලක්වී තිබූ අතර රථය අළුත්වැඩියා කිරීමට විශාල වියදමක් කළ යුතු බැවින් හා එම රථය වර්ෂ 12කට වඩා පැරණි බැවින් රක්ෂණ ආයතනයෙන් ලබා දීමට එකඟ වී තිබූ රු.1,200,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.12 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 2 |
| (ii). | තෘතියික මට්ටම | 5 | 5 | - |
| (iii). | ද්විතියික මට්ටම | 71 | 52 | 19 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 31 | 29 | 2 |
| | **එකතුව** | **122** | **99** | **23** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**---------------------------------------------------------------------**

ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 2.5.1 වගන්තියට පටහැනිව නිලධාරීන් 04 දෙනෙකු 2013 වර්ෂයේ සිට අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයක් වෙත මුදාහැර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම මුදාහැරි මානව සම්පත් සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.660,808 ක් වැය කර තිබුණි.